# ග්‍රාම සංවර්ධන සැලැස්ම

## උද්‍යාන-536 A



ප්‍රාදේශීය ලේකම් කාර්යාලය-දෙහිවල

# 536 A - උදයාන

# ග්‍රාම සංවර්ධන සැලැස්ම



ආර්ථික සංවර්ධන නිලධාරී

එච්.ඒ.තුසිත ශාන්ත මහතා

**පටුන** **පිටු අංකය**


## 1 වන කොටස හැඳින්වීම

1.1 පසුබිම 1

1.2 ග්‍රාම සංවර්ධන සැලැස්මේ අරමුණ 1

1.3 ක්‍රමවේදය 1-2

## 2 වන කොටස මූලික තොරතුරු

2.1 ස්ථානය සහ ප්‍රවේශ්‍යතාව 3

2.1.1 වසමේ සිතියම 3

2.2 මූලික තොරතුරු 3

2.3 යටිතල පහසුකම් 4

2.4 ජනගහනය 6

2.5 නිවාස වර්ග 7

2.6 අධ්‍යාපනය 8

2.7 පදිංචිකරුවන් පිළිබඳ නියාමනයක් ඇති කිරීම 11

2.8 සෞඛ්‍යය 12

2.9 පානීය ජල පහසුකම් 13

2.10 සනීපාරක්ෂක පහසුකම් 14

2.11 ප්‍රජා සංවිධාන 14

## 3 වන කොටස ජීවනෝපාය විශ්ලේෂණය

3.1 වෘත්තීන් වර්ග සහ ආදායම් මට්ටම 16

3.2 දරිද්‍රතා මට්ටම 17

3.3 ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා සංවර්ධනය 17

3.4 ගම් ප්‍රජා මට්ටමේ සංවර්ධන අභියෝග 19

3.5 ගමේ තරුණ මට්ටමේ සංවර්ධන අභියෝග 19

3.6 වසම තුල ඇති පොදු සංවර්ධන අභියෝග 20

## 4 වන කොටස ග්‍රාම සංවර්ධන සැලැස්ම

4.1 ව්‍යුහාත්මක ක්‍රියා 23

4.2 ව්‍යුහාත්මක නොවන ක්‍රියා 24

වගු ලැයිස්තුව


වගුව 1 ගම් සංවර්ධන සැලැස්මේ මාර්ගෝපදේශ (VDP) සැකසීමේ ක්‍රියාවලිය 2

වගුව 2 මූලික තොරතුරු 3

වගුව 3 භෞතික යටිතල පහසුකම් 5

වගුව 4 වසම තුල හා පිටත ඇති යටිතල පහසුකම් 6

වගුව 5 ජනගහන ව්‍යාප්තිය 6

වගුව 6 කුඩා නිවාස වෙනුවට රජය මගින් ක්‍රියාත්මක වන මහල් නිවාස යෝජනා ක්‍රමයක් 7

වගුව 7 පාසැල් සංවර්ධනය 8

වගුව 8 පුස්තකාල පහසුකම් ඇති කිරීම 9

වගුව 9 පාසැල් විෂය නිර්දේශය අනුව පවත්වාගෙන යනු ලබන රාජ්‍ය අනුග්‍රහය සහිත කලායතනයක් 10

වගුව 10 කුඩා නිවාස වෙනුවට රජය මගින් ක්‍රියාත්මක වන මහල් නිවාස යෝජනා ක්‍රමයක් 11

වගුව 11 තාවකාලික පදිංචිකරුවන් පිළිබඳ නියාමනයක් ඇති කිරීම 12

වගුව 12 ආයුර්වේද සායනයක් හා ඖෂධ ශාලාවක් ස්ථාපිත කිරීම 12

වගුව 13 ජල නල පීඩනය විධිමත් කිරීම 13

වගුව 14 වසමේ සනීපාරක්ෂක පහසුකම් 14

වගුව 15 කාර්ය සාධනය පිළිබඳ තෘප්තියේ මට්ටම 15

වගුව 16 ස්වයං රැකියා වෙළඳපොළ නිර්මාණය කිරීම 16

වගුව 17 සමෘද්ධි සංවර්ධනය හා වැඩිහිටි, ආබාධිත දීමනා 17

වගුව 18 තීරණ ගැනීමේදී කාන්තාවන්ගේ කාර්යභාරය 18

වගුව 19 ප්‍රජා මට්ටමේ සංවර්ධන අභියෝග 19

වගුව 20 තරුණ මට්ටමේ සංවර්ධන අභියෝග 20

වගුව 21 ප්‍රජා ශාලාව වැඩි දියුණු කිරීම 20

වගුව 22 ඉරිදා පොළ සඳහා වාහන නැවැත්වීමේ ස්ථානයක් හඳුන්වාදීම 20

වගුව 23 දහම් පාසැල් සඳහා දරුවන් යොමු කිරීම 21

වගුව 24 ව්‍යුහාත්මක ක්‍රියා 23

වගුව 25 ව්‍යුහාත්මක නොවන ක්‍රියා 24

# 1. කොටස හැඳින්වීම

### 1.1 පසුබිම

වසමක අනාගතය උදෙසා සැලසුම් සකස් කිරීම ආරම්භ වන්නේ සමාජ, ආර්ථික, දේශපාලන හා පාරිසරික බලවේගයන්ගේ හැසිරීම් , ප්‍රවනතාවයන් පාදක කර ගනිමිනි. එය එසේ වන්නේ නගරයක සංවර්ධනය හැඩ ගැසීම සිදුවන්නේ ඉහත බලවේගයන්ගේ අඩු සහෝ වැඩි වශයෙන් වන බල පැවැත්සීම මත වන බැවින් හා ඒවා අන්‍යෝන්‍ය වශයෙන් එකිනෙකා කෙරෙහි විනාශකාරී හෝ ප්‍රගමනකාරී ලෙස නගර සංවර්ධනයට හේතු වීම මතය. මෙලෙස වසමක විකාශය, වෙනස්වීම අනිවාර්ය ක්‍රියාවලියක් වන නමුත් වසමක යහ පැවැතම සඳහා නිවැරැදී ඉදිරි දර්ශනයක් සමග වසමේ පවතින විභවතාවන් ප්‍රයෝජනයට ගනිමින් නව සංවර්ධන අවස්තාවන් උදාකර දීම හා සංවර්ධන ප්‍රතිලාභ ජනතාවට ලබාදීම අරමුණු කොට ගනිමින් ග්‍රාම සංවර්ධන සැලැස්ම සකස් කිරීම සිදු කරයි.

### 1.2 ග්‍රාම සංවර්ධන සැලැස්මේ අරමුණ (VDP)

ග්‍රාම සංවර්ධන සැලැස්ම සකස් කිරීමේ පරමාර්ථය වන්නේ ගමක සංවර්ධන ගැටළු හඳුනාගෙන ප්‍රමුඛතාවය දී ගම නැතහොත් වසම සංවර්ධනය කිරීමයි. සක්‍රීය ප්‍රජා සහභාගීත්වය සහ දේශීය සම්පත් ඵලදායී ලෙස භාවිතා කිරීම සඳහා දිරිමත් කරන යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.

සංවර්ධන ගැටළු හඳුනා ගැනීමේදී කෙටිකාලීන, මධ්‍යම හා දිගු කාලීන ලෙස ඉදිරි සංවර්ධන දර්ශනයකින් විසඳුම් සොයා ගැනීම ග්‍රාම සංවර්ධන සැලසුම් මගින් විස්තරාත්මකව අධ්‍යනය කෙරේ. ප්‍රධාන වශයෙන් පදනම් වී ඇත්තේ ගමේ ප්‍රජාවගේ භෞතික, සමාජ, ආර්ථික, ජීවනෝපාය හා සංස්කෘතික විශ්ලේෂණය මත සංවර්ධන ගැටළු හඳුනා ගැනීම සහ ප්‍රමුඛතාවය ලබා දීම වේ.

ගමක සංවර්ධන සැලැස්ම. VDP විසින් ප්‍රජා සහ බාහිර මට්ටමේ ක්‍රියාකාරකම් හඳුනා ගැනීම හා හඳුනාගත් සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම මෙන්ම බොහෝ දුරට ඔවුන්ගේ සමස්ත සමාජ-ආර්ථික යහපැවැත්ම සඳහා අනාගත දැක්මක් සහ මාර්ග සිතියමක් සංවර්ධනය කිරීම හා ප්‍රජාවගේ සමෘද්ධිය තුලින් තෘප්තිමත් පුරවැසියෙක් බිහි කිරීමයි. VDP කාර්යක්ෂමව ලබා ගැනීමේදී ප්‍රජා ආයතනවල ප්‍රධාන භූමිකාව මෙන්ම ගෘහ, අසල්වැසි සහ ගම් මට්ටමින් සංවර්ධන සේවා සපයන රාජ්‍ය හා පෞද්ගලික ආයතන, පළාත් පාලන ආයතන, පරිත්‍යාගශීලීන් සහ උපදේශකයින් සේවා ලබා ගැනීම ඉතා වැදගත් වන අතර සහ හඳුනාගත් සංවර්ධන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේදී රාජ්‍ය නොවන සංවිධානවල බාහිර සහයෝගය ඉතා වැදගත් වේ.

### 1.3 ක්‍රමවේදය

I. ප්‍රමාණාත්මක දත්ත එකතු කිරීමේදී සංවර්ධන සේවා සපයන රාජ්‍ය හා පෞද්ගලික ආයතන, පළාත් පාලන ආයතන, පරිත්‍යාගශීලීන් සහ උපදේශකයින් රාජ්‍ය නොවන සංවිධානවල පර්යේෂණ ක්‍රමවේදයන් භාවිතා කරන ලදී
II. VDP සකස් කිරීම සම්බන්ධ ගුණාත්මක දත්ත සැලැස්මේ සවිස්තරාත්මක ආකෘතියකින් සකස් විය යුතුය.
III. ප්‍රජා ආයතනවල නියෝජිතයන් සමඟ සාකච්ඡා කර සකස් කර අවසන් කර සකස් කර ගන්නා සක්‍රීය ග්‍රාම සංවර්ධන සැලැස්ම.
IV. VDP ක්‍රියාවලියේ සෑම අදියරකදීම අදාළ වසමේ ජීවත්වන ජ්රජාවගේ සහභාගීත්වය සහතික කරන ක්‍රමවේදයක් අනුව හා ගමක, ප්‍රාදේශීය ප්‍රජා කණ්ඩායම්වල මූලික සංවර්ධන දර්ශක පිළිබඳ ප්‍රමාණාත්මක දත්ත රැස් කිරීම.

V. විවිධ මට්ටමේ සමාජ-ආර්ථික හා ජීවනෝපාය විශ්ලේෂණයන් සඳහා කාන්තාවන් සහ තරුණයින් සම්බන්ධ කිරීම
VI. ඔවුන්ගේ වසමේ අවශ්‍ය සංවර්ධන මැදිහත්වීම් හඳුනා ගැනීම සහ ප්‍රමුඛතාවය දීම.
VII. සංවර්ධන සැලැස්ම (VDP) සෑදීමේ ක්‍රියාවලිය, ප්‍රජා ආයතනවල ක්‍රියාකාරී සහභාගීත්වය
VIII. ප්‍රජා හිමිකාරිත්වය සංවර්ධනය කිරීම.
IX. ග්‍රාමීය ප්‍රජාව, සමාජ සිතියම්කරණය, කාල රේඛාව, වැනි විවිධ සහභාගීත්ව පර්යේෂණ මෙවලම තීරණ ගැනීමේ ආකෘතිය, ධනය ශ්‍රේණිගත කිරීම,
X. අවධානය යොමු කරන කණ්ඩායම් සාකච්ඡා, ගැටළු ශ්‍රේණිගත කිරීම, ගැටළු හඳුනා ගැනීම සහ ප්‍රමුඛතාවය සහ සැලසුම් සකස් කිරීම.
XI. විවිධ මට්ටමේ ගුණාත්මක දත්ත එක්රැස් කිරීම හා විශ්ලේෂණය කිරීම සඳහා අභ්‍යාස සම්පූර්ණයෙන් යොදා ගන්නා ලදී.

**වගුව 1: ගම් සංවර්ධන සැලැස්මේ මාර්ගෝපදේශ (VDP) සැකසීමේ ක්‍රියාවලිය**


| මාර්ගෝපදේශ මූලධර්ම | ඇතුලත් ක්‍රියාකාරකම් |
|---|---|
| සහභාගීත්වය | වසම් මට්ටමින් පුළුල් ප්‍රජා පාදක රැස්වීම්<br>වසම තුළ සියලුම ප්‍රජා අංශවල සහ ප්‍රජා නියෝජිතයින් ඇතුළත් වේ.<br>ග්‍රාම සංවර්ධන සැලැස්මට ඉඩම් නොමැති සහ වසමේ අඩු ආදායම් ලාභීන් ඇතුලත් විම.<br>කාන්තාවන් සහ තරුණයින් ඇතුළු සියලුම ප්‍රජා අංශ සහභාගී විය. |
| ඒකාබද්ධ ප්‍රවේශය | ඒකාබද්ධ සංවර්ධනයේ සියලු අංශ පිළිබඳ තොරතුරු රැස් කිරීම<br>ප්‍රමාණාත්මකතාව අනුව විවිධ ඉඩම් පරිහරණ, යටිතල පහසුකම් සහ මහජනතාව සඳහා මැදිහත්වීම් හඳුනාගෙන ඇත.<br>පහසුකම්, දරිද්‍රතාවය අවම කිරීම සහ ජීවනෝපාය වැඩි දියුණු කිරීම.<br>ප්‍රජා ආයතනවල සහ ප්‍රතිලාභීන්ගේ වගකීම් හඳුනාගෙන ඇත. |
| වගවීම සහ විනිවිදභාවය | ප්‍රජාවේ සමස්ත සැලසුම් ක්‍රියාවලියම සහභාගී විය.<br>සැලැස්ම තුළ වගකීම් පැහැදිලිව හඳුනාගෙන ඇත (උදා: ප්‍රජාව, සේවාව සපයන්නන්)<br>සැලසුම් ලේඛනය වසමේ ප්‍රජාවගේ දේපළ වන අතර එය සියල්ලන්ටම ප්‍රවේශ විය හැකිය.<br>ප්‍රජා සාමාජිකයින් /ප්‍රතිලාභීන් මැදිහත්වීම් ස්ථාන විවෘතව හඳුනා ගනී.<br>ප්‍රජා රැස්වීම් තුළින් වරින් වර සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ඉදිරිපත් කළ යුතුය. |

## 2 වන කොටස මූලික තොරතුරු

### 2.1 ස්ථානය සහ ප්‍රවේශය.

කොළඹ දිස්ත්‍රික්කයේ දෙහිවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් වසම් 15 අතරින් උද්‍යාන වසම උතුරු දෙසින් කළුබෝවිල වසමටත් නැගෙනහිර දෙසින් නැදිමාල වසමටත් බටහිර දෙසින් දෙහිවල නැගෙනහිර වසමටත් දකුණු දෙසින් කරගම්පිටිය වසමටත් මායිම්ව වර්ග කිලෝමීටර 0.5 ක් පුරා විසිරී ඇත.

#### 2.1.1 වසමේ සිතියම




### 2.2 මූලික තොරතුරු

පහත දැක්වෙන්නේ උද්‍යාන වසම ඇතුළත සහ පිටත පිළිබඳ මූලික තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

**වගුව 2 : මූලික තොරතුරු**

| | | |
|---|---|---|
| වසම තුල ඇති උප ගම් ප්‍රමාණය | නැත | |
| ජනගහනය | 5584 | |
| මුළු භූමි ප්‍රමාණය<br>වර් කි.මී. | 0.53 | |
| ජන වර්ගයන් අනුව | සිංහල | 3690 |
| | මුස්ලිම් | 1046 |
| | දමිළ | 822 |
| | වෙනත් | 26 |

උද්‍යාන වසම තුල රාජ්‍ය ආයතන ලෙස ජාතික සත්වෝද්‍යානය, ජාතික ජලප්‍රවාහන මණ්ඩලය, රාජකීය ප්‍රාථමික විද්‍යාලය, එස්. ද. එස්. ජයසිංහ විද්‍යාලය හා සමුපකාරය පිහිටා ඇත. මීට අමතරව විහාරස්ථාන 2 ක් හා දස සිල් ආශ්‍රමයක්ද උද්‍යානය සතුය. පොදු පරිහරණය සඳහා නාන ළිං දෙකකින්ද ක්‍රීඩාංගනයකින් හා සණස බැංකුවකින් මෙන්ම ප්‍රජා ශාලාවකින් වසම පොහොසත් වේ. මෙම වසම තුල මාර්ග පද්ධතිය වසම පුරා විහිදී යන අතර ගල්විහාර පාර ඉන් ප්‍රධාන වේ. මෙම වසම තුල අඩි 15 ත් 20 ත් අතර මාර්ග ප්‍රධාන වශයෙන් දැකිය හැකිය. සමස්ථයක් මාර්ල කාපට් කර ඇති අතර සුළු ප්‍රමාණයක් ගල් අතුරා තාර දමා හා කුට්ටි ගල් අතුරා ඇත. මෙම මාර්ග ප්‍රධාන වශයෙන් අතුරු මාර්ග වේ.

විවිධ වූ ජීවනෝපාය ක්‍රම යටතේ තම ජීවිතය පවත්වාගෙන යන බහුවිධ පිරිසක් ජීවත්වන උද්‍යාන වසම තුල බහුතරයක් තම ශ්‍රමය කැපකර ආදායම් උත්පාදන මාර්ගවල නිරත වී ඇත. අනෙකුත් පිරිස වෘත්තිමය හා මානසික ශ්‍රමය වැය කර ආදායම් උපයාගනු ඇත. මෙම විශේෂීකරණය හේතුවෙන් පැහැදිලි ආදායම් බෙදීයාමේ විශමතාවයක් දක්නට ලැබේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස අඩු ආදායම්ලාභීන් ඉහළ අගයක් ගනියි.

## 2.3 යටිතල පහසුකම්

### මාර්ග, පාලම් හා කානු පද්ධති අළුත්වැඩියාව

උද්‍යාන වසම තුල මාර්ග පාලම් හා කානු පද්ධතිය අළුත්වැඩියා හා නවීකරණය වහා කළ යුතුව ඇත. ප්‍රධාන වශයෙන් මෙම වසමේ පිහිටීම අනුව මාර්ග පද්ධතිය අළුත්වැඩියා කිරීමෙන් රථ වාහන ගමනාගමනයට මෙන්ම විශේෂයෙන් ගාලු පාර මගහැර කොළඹ දෙසට ධාවනය කළ හැකි විකල්ප මාර්ග ලෙස භාවිතයට ගැනීමෙන් රථ වාහන තදබදය අවම කර ගත හැකිය. වසම තුල පිහිටා ඇති මාර්ගවල ඉඩ ප්‍රමාණය අනුව වාහන හුවමාරු වීම පහසුවෙන් කරගත නොහැකි වීම. එබැවින් සංවර්ධන ක්‍රියාවලිය තුල මාර්ග පුළුල් කිරීම ප්‍රමුඛ කාර්යය වන අතර ඒ සඳහා ඉඩ පහසුකම් ලබා ගැනීම අසීරු කාර්යයක් වන අතර ඒ සඳහා දැරිය යුතු පිරිවැය අධික වේ

**වගුව 3 : භෞතික යටිතල පහසුකම්**

| පහසුකම් වර්ගය | මාර්ගයේ නම | දිග (අඩි) පළල (අඩි) | වර්තමාන තත්වය (හොඳයි=1 දුර්වල = 0) | ප්‍රතිලාභීන් ගණන | වගකීම |
|---|---|---|---|---|---|
| මාර්ග පද්ධතිය | නැදිමාල පාලම අසල සිට ප්‍රතිබිම්බාරාම පාලම දක්වා ඇළ මාර්ගය අසල මාර්ගය සංවර්ධනය කිරීම | 2400<br>20 | 0 | 2500 | මාර්ග සංවර්ධන අධිකාරිය.<br>පහත්බිම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ මංඩලය.<br>දෙහි/ ගල් මහ නගර සභාව |
| | ගල්විහාර පාර හා කඩවත පාර යා කෙරෙන පාලම පුළුල් කර අළුත්වැඩියා කිරීම හා ගල්විහාර පිවිසුම් මාර්ගය කාපට් කිරීම. | 350<br>15 | 0 | 1500 | මාර්ග සංවර්ධන අධිකාරිය.<br>පහත්බිම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ මංඩලය.<br>දෙහි/ ගල් මහ නගර සභාව |
| | සමන් මාවත කෙලවර කඩවත පාරට යා කරන පාලම දක්වා සංවර්ධනය කර පුළුල් කිරීම. | 1800<br>18 | 0 | 2000 | මාර්ග සංවර්ධන අධිකාරිය.<br>පහත්බිම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ මංඩලය.<br>දෙහි/ ගල් මහ නගර සභාව |
| පාලම් පද්ධතිය | ගල් විහාර පෙදෙසට ඇති පිවිසුම් මාර්ගය අසල ඇති | 25<br>15 | 0 | 3000 | මාර්ග සංවර්ධන අධිකාරිය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | පාලම සංවර්ධනය කිරීම. | | | | පහත්බිම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ මංඩලය. දෙහි/ ගල් මහ නගර සභාව |
| කාණු හා බෝක්කු පද්ධතිය | වනරතන පාර අංක 7 ස්ථානයෙන් ආරම්භ වන බෝක්කුව සංවර්ධය කිරීම. | 15 10 | | 1200 | දෙහි/ ගල් මහ නගර සභාව. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| | ගල්වල පාර ප්‍රතිබිම්බාරාම පාරට පිවිසෙන ස්ථානයේ සිට වරිපනම් අංක 161 සීමාව දක්වා කානුව අළුත්වැඩියා කිරීම. | 650 15 | 0 | 1600 | දෙහි/ ගල් මහ නගර සභාව. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| | ගලවිහාර පාරේ සමන් මාවත(සණස පෙදෙස) දෙපස බෝක්කුව අළුත්වැඩියා කිරීම. | පළල 15 | 0 | 1600 | දෙහි/ ගල් මහ නගර සභාව. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| | ගල්විහාර පාර හිල් වීදියෙන් ආරම්භ වන ස්ථානයේ සිට සීල මාතා ආශ්‍රමය පිවිසුම දක්වා ඇති කොටසේ කානුව අළුත්වැඩියා කර Cover slab යෙදීම. | 200 01 | 0 | 1000 | දෙහි/ ගල් මහ නගර සභාව. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |

**වගුව 4 : වසම තුල හා පිටත ඇති යටිතල පහසුකම්**

| අනු අංකය | පවත්නා පහසුකම් | වසම තුල (Y) වසමින් පිටත (N) |
|---|---|---|
| 1 | පාසැල් | Y |
| 2 | රාජ්‍ය ආයතන | Y |
| 3 | පෞද්ගලික පාසැල් | Y |
| 4 | බැංකු | N |
| 5 | ආගමික ස්ථාන | Y |
| 6 | රජයේ රෝහල් | N |
| 7 | පෞද්ගලික රෝහල් | N |
| 8 | ග්‍රාමීය සමූපාකාර | Y |
| 9 | සණස බැංකු | Y |
| 10 | ප්‍රජා සෞඛ්‍ය මධ්‍යස්ථාන | N |
| 11 | වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන | N |
| 12 | පොලිස් ස්ථාන | N |
| 13 | පශු වෛද්‍ය සායන | N |
| 14 | දුම්රිය ස්ථාන | N |
| 15 | සුපිරි වෙළඳසැල් | N |

උද්‍යාන වසම තුල රාජ්‍ය ආයතන ලෙස ජාතික සත්වෝද්‍යානය, ජාතික ජලප්‍රවාහන මණ්ඩලය, රාජකීය ප්‍රාථමික විද්‍යාලය, එස්. ද. එස්. ජයසිංහ විද්‍යාලය හා සමූපකාරය පිහිටා ඇත. මීට අමතරව විහාරස්ථාන 2 ක් හා දස සිල් ආශ්‍රමයක්ද උද්‍යානය සතුය.

**2.4 ජනගහනය**

මුළු ජනගහනය 5584 න් 3258 පිරිමි වන අතර 2326 ගමේ කාන්තා ජනගහනය වේ. බහුතර ජනතාව බෞද්ධ වන අතර එය 3504 කි. දමිල ජනගහනය 729 ද ඉස්ලාම් 1046 ද කතෝලික 300 ද වේ. ආබාධිත ජනගහනය 30 ක් වන අතර ඉන් 27 ක් වේ ශාරීරික ආබාධිත පුද්ගලයින් 3 දෙනෙකු මානසික ආබාධිතයන් සහිත වේ.

**වගුව 5 : ජනගහන ව්‍යාප්තිය**

| **ජනගහනය** | **5584** |
|---|---|
| පිරිමි 3258 | කාන්තා 2326 |
| බෞද්ධ | 3504 |
| දමිල | 729 |
| ඉස්ලාම් | 1046 |
| කතෝලික | 30 |

**2.5 නිවාස වර්ග**

උද්‍යාන වසම තුල සුඛෝපභෝගී නිවාස (25%) මෙන්ම සාමාන්‍ය මධ්‍යම පාන්තික නිවාස (30%) හා පැල්පත් නිවාස (45%) වශයෙන් වර්ගීකරණය කළ හැක. වසම තුල A, B හා C නිවාස විශේෂයෙන් පැල්පත් නිවාස වන අතර මේවා බහුතරයක් ඇළ ඉවුර මත ඉදිකර ඇති අනාරක්ෂිත අනවසර ඉදිකිරීම් වේ. විශේෂයෙන් මෙම නිවාස වර්ග අඩි 500 කට පමණ සීමා වන අතර එක නිවසක කුටුම්භ 2 ක් ජීවත්වන අවස්ථා දැකිය හැක.

වගුව 6 : කුඩා නිවාස වෙනුවට රජය මගින් ක්‍රියාත්මක වන මහල් නිවාස යෝජනා ක්‍රමයක්

| අවශ්‍යතාවය | ගැටළුව | වර්තමාන තත්වය (හොඳයි = 1, දුර්වල = 0) | ප්‍රතිලාභීන් ගණන | සංවර්ධන යෝජනා | වගකීම |
|---|---|---|---|---|---|
| නවීන පහසුකම් සහිත රාජ්‍ය මහල් නිවාස යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම තුලින් පැල්පත් වාසී ජනයාගේ ජීවන තත්වය උසස් වන අතර අභිමානවත් ජීවිතයක් ගත කිරීමේ හැකියාව උදාවේ. | උද්‍යාන වසමේ A, B හා C නිවාස විශේෂයෙන් පැල්පත් නිවාස ලෙස පැවතීම හා ඔවුන් විසින් ඇළ ඉවුර මත අනාරක්ෂිත ලෙද නිවාස ඉදි කිරීමෙන් අනාරක්ෂිත මෙන්ම රජයේ ඉඩම් අවභාවිතා කිරීමක් සිදුකර ඇති බැවින් ඔවුන් සඳහා මහල් නිවාස ක්‍රමයක් යෝජනා කිරීම. මෙහිදී යෝජනා ක්‍රමය සඳහා භූමි ප්‍රමාණ හඳුනා ගැනීම හා නිවාස ඉදිකිරීම සඳහා දැරිය යුතු පිරිවැය ඉහළ මට්ටමක පැවතීම | 0 | 1500 | I. නිවාස සංවර්ධන අධිකාරිය සමඟ යම්කිසි ක්‍රමවේදයක් සකස් කර මහල් නිවාස ඉදි කිරීම. | නිවාස සංවර්ධන අධිකාරිය දෙහි/ ගල් මහ නගර සභාව. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ජාතික සත්වෝද්‍යානය පහත්බිම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ මංඩලය. |
| | | | | ඔවුන් විසින් දැනට ජීවත්වන නිවාස සඳහා වන්දි මුදල් ගෙවීම | |
| | | | | මාසික ගෙවීමේ පදනම මත අවසානයේ ඔවුන් සඳහා නිවාසවල හිමිකාරිත්වය පැවරෙන ආකාරයට නිවාස ලබාදීම. | |

## 2.6 අධ්‍යාපනය

වසමේ සමස්ත සාක්ෂරතා අනුපාතය ඉහල අගයක් ගන්නා අතර කාන්තාවන්ගේ සංඛ්‍යාව තරමක් අඩුය. වසම තුල ඇති පාසැල් දෙකම ක්‍රියාත්මක වන අතර එක් පාසැලක් ප්‍රාථමික පාසැලක් වන අතර අනෙක මධ්‍ය මහා විද්‍යාලයකි.ඒ අනුව වසමේ මධ්‍යම හෝ ද්විතීයික මට්ටමේ අධ්‍යාපනයක් සඳහා පහසුකම් ඇත. පාසැල් යන දරුවන් තරමක් ඉහළයි. නමුත් වසම තුල ඇති පාසැල් සඳහා ළමයින් ඇතුළත් වීමේ සම්භාවිතාවය තරමක් අඩුය.

වගුව 7 : පාසැල් සංවර්ධනය

| අවශ්‍යතාවය | ගැටළුව | වර්තමාන තත්වය (හොඳයි=1 දුර්වල = 0) | ප්‍රතිලාභීන් ගණන | සංවර්ධන යෝජනා | වගකීම |
|---|---|---|---|---|---|
| උද්‍යාන වසම තුල ඇති පාසැල් සංවර්ධනය කිරීම තුලින් වසම හා ඉන් පිටත සිටින දරුවන් සඳහා විධිමත් අධ්‍යාපන ක්‍රමයක් සකස්කර ගත හැකිය. ප්‍රධාන වශයෙන් වසම හා අවට සිටින මධ්‍යම හා ඉහළ ආදායම් ලබන දරුවන් මෙම පාසැල් සඳහා යොමු කිරීමට නැඹුරුතාවක් ඇති කරගත හැකිය. | ප්‍රදේශයේ පිහිටා ඇති පාසැල් දෙකෙහි දැනට පවතින ක්‍රීඩා පහසුකම්, ගොඩනැගිලි ගුරුවරු හා පාසැල වෙත ළමුන් යොමුකර ගැනීම සම්බන්ධයෙන් පවතින දුෂ්කරතා. | 0 | 2200 | රාජකීය ප්‍රාථමික විද්‍යාලයේ තෙමහල් ගොඩනැගිල්ල අළුත්වැඩියාව | අධ්‍යාපන අමාත්‍යංශය. කලාප අධ්‍යාපන කාර්යාලය. |
| | •වෙනත් පාසල්වලට ප්‍රවේශවීමේ හැකියාව | | | ජයසිංහ මධ්‍ය මහා විද්‍යාලයේ පුස්තකාල පහසුකම් වැඩි දියුණු කිරීම. | |
| | පාසල් ගුරුවරුන් නොමැතිකම සහ ඔවුන් නොපැමිණීම | | | ජයසිංහ මධ්‍ය මහා විද්‍යාලයේ මහින්දෝදා විද්‍යාගාරය වැඩි දියුණු කිරීම හා පිළිසකර කිරීම. | |
| | | | | විද්‍යාලයට අවශ්‍ය ක්‍රීඩා පහසුකම් සංවර්ධනය කිරීම. (නෙට්බෝල් හා වොලිබෝල් ක්‍රීඩා පිටි) | |
| | | | | පවතින ගුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීම | |
| | | | | පාසැල් විනය සම්බන්ධයෙන් නියාමනයක් ඇති කිරීම. | |
| | | | | මධ්‍යම පාන්තික හා ඉහළ ආදායම් ලබන්නන්ගේ දරුවන් පාසැල වෙත ගෙන්වා ගැනීම සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙලක් සකස් කිරීම | |

වගුව 8 : පුස්තකාල පහසුකම් ඇති කිරීම

| අවශ්‍යතාවය | ගැටළුව | වර්තමාන තත්වය (හොඳයි = 1, දුර්වල = 0) | ප්‍රතිලාභීන් ගණන | සංවර්ධන යෝජනා | වගකීම |
|---|---|---|---|---|---|
| මූලිකවම විෂය නිර්දේශය අනුව සකස් | පුස්තකාලයක් පවත්වාගෙන යාම සඳහා ප්‍රමාණවත් ඉඩ | **0** | | රාජ්‍ය මැදිහත්වීම සහිතව ***එක් නිවසකින් එක් පොතක්*** යන | අධ්‍යාපන අමාත්‍යංශය කලාප අධ්‍යාපන |

| | | | | | |
|---|---|---|---|---|---|
| කරන ලද හා අනෙකුත් ක්ෂේත්‍රයන් නියෝජනය වන පරිදි රාජ්‍ය අනුග්‍රහය සහිත පුස්තකාලයක් ස්ථාපිත කිරීම තුලින් ප්‍රදේශයේ අධ්‍යාපනය හදාරන දරුවන් සඳහා තම අධ්‍යාපන කටයුතු සාර්ථක කර ගැනීම සඳහා උපකාරවනු ඇත. | පහසුකම් නොමැතිවීම හා සම්පත් සපයා ගැනීමේදී දැරිය යුතු විශාල පිරිවැය | | | සංකල්පය යටතේ සෑම නිවසකින්ම පරිහරණය කල හැකි පොත් පුස්තකාලයට ලබා ගැනීම | කාර්යාලය දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව ප්‍රාදේශී ලේකම් කාර්යාලය |
| | | | | යෝජිත සේවා පියස තුල නව පුස්තකාල ගොඩනැගිල්ලක් ඉදි කිරීම පුස්තකාල සඳහා ග්‍රාම නිලධාරි හෝ සංවර්ධන නිලධාරි අධීක්ෂණය යටතේ පවත්වාගෙන යාම. | |

**වගුව 9 : පාසැල් විෂය නිර්දේශය අනුව පවත්වාගෙන යනු ලබන රාජ්‍ය අනුග්‍රහය සහිත කලායතනයක්**

| අවශ්‍යතාවය | ගැටළුව | වර්තමාන තත්වය (හොඳයි = 1, දුර්වල = 0) | ප්‍රතිලාභීන් ගණන | සංවර්ධන යෝජනා | වගකීම |
|---|---|---|---|---|---|
| උද්‍යාන වසම තුල රාජ්‍ය අනුග්‍රහය සහිත කලායතනයක් ආරම්භ කිරීමෙන් බහුතර අඩු ආදායම් පවුල්වල අධ්‍යාපනය හදාරන දරුවන්ගේ විෂය දැනුම | **විෂය දැනුම සහිත ප්‍රමාණවත් ගුරුවරුන් නොමැතිවීම හා කලා කටයුතු හැදෑරීම සම්බන්ධයෙන් අවශ්‍ය අධ්‍යාපන උපකරණ හිඟය හා උපකරණ මිලදී ගැනීම** | **0** | **2000** | **I. කලා කටයුතු සම්බන්ධයෙන් සංස්කෘතික දෙපාර්තමේන් තුව සමඟ ක්‍රමවත් වැඩ පිළිවෙලක් ඇති කිරීම.** | අධ්‍යාපන අමාත්‍යංශය<br>කලාප අධ්‍යාපන කාර්යාලය<br>දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව<br>ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| | | | | **II. කලා කටයුතු සම්බන්ධයෙන් ප්‍රජා ශාලාව වැඩි දියුණු කර මේ සඳහා ඉඩ** | |

| | | | | | |
|---|---|---|---|---|---|
| වර්ධනය කර ගත හැක. මෙමගින් අමතරව පිරිවැයක් වැය නොකර අධ්‍යාපන කටයුතු ඉදිරියට කරගෙන යෑමේ අවස්ථාව උදාවේ. | සඳහා දැරිය යුතු පිරිවැය ඉහළ මට්ටමක පැවතීම හා අධ්‍යයන කටයුතු සඳහා සුදුසු ඉඩ පහසුකම් සහිත ශාලාවක් නොමැතිවීම. | | | පහසුකම් ලබා ගැනීම.<br><br>III. උපකරණ සපයා ගැනීම සම්බන්ධයෙන් රාජ්‍ය ආයතන සම්බන්ධීකරණය කර ගැනීම. | |

**2.7 පදිංචිකරුවන් පිළිබඳ නියාමනයක් ඇති කිරීම**

වගුව 10 : කුඩා නිවාස වෙනුවට රජය මගින් ක්‍රියාත්මක වන මහල් නිවාස යෝජනා ක්‍රමයක්

| අවශ්‍යතාවය | ගැටළුව | වර්තමාන තත්වය (හොඳයි = 1, දුර්වල = 0) | ප්‍රතිලාභීන් ගණන | සංවර්ධන යෝජනා | වගකීම |
|---|---|---|---|---|---|
| නවීන පහසුකම් සහිත රාජ්‍ය මහල් නිවාස යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම තුලින් පැල්පත් වාසී ජනයාගේ ජීවන තත්වය උසස් වන අතර අභිමානවත් ජීවිතයක් ගත කිරීමේ හැකියාව උදාවේ | උද්‍යාන වසමේ A, B හා C නිවාස විශේෂයෙන් පැල්පත් නිවාස ලෙස පැවතීම හා ඔවුන් විසින් ඇළ ඉවුර මත අනාරක්ෂිත ලෙද නිවාස ඉදි කිරීමෙන් අනාරක්ෂිත මෙන්ම රජයේ ඉඩම් අවභාවිතා කිරීමක් සිදුකර ඇති බැවින් ඔවුන් සඳහා මහල් නිවාස ක්‍රමයක් යෝජනා කිරීම. මෙහිදී යෝජනා ක්‍රමය සඳහා භූමි ප්‍රමාණ හඳුනා ගැනීම හා නිවාස ඉදිකිරීම සඳහා දැරිය යුතු පිරිවැය ඉහළ මට්ටමක පැවතීම | 0 | 1500 | නිවාස සංවර්ධන අධිකාරිය සමඟ යම්කිසි ක්‍රමවේදයක් සකස් කර මහල් නිවාස ඉදි කිරීම.<br><br>ඔවුන් විසින් දැනට ජීවත්වන නිවාස සඳහා වන්දි මුදල් ගෙවීම<br><br>මාසික ගෙවීමේ පදනම මත අවසානයේ ඔවුන් සඳහා නිවාසවල හිමිකාරිත්වය පැවරෙන ආකාරයට නිවාස ලබාදීම. | නිවාස සංවර්ධන අධිකාරිය දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව<br><br>ප්‍රාදේශී ලේකම් කාර්යාලය |

වගුව 11 : තාවකාලික පදිංචිකරුවන් පිළිබඳ නියාමනයක් ඇති කිරීම

| | |
|---|---|
| **අවශ්‍යතාවය** | උද්‍යාන වසම තුල තාවකාලික පදිංචිකරුවන් සැලකිය යුතු මට්ටමක සිටින අතර ඔවුන්ගේ ලියා පදිංචිය හා අනන්‍යතාවය පිළිබඳ ගැටළු නිරාකරණය කර ගැනීම. |
| **ගැටළුව** | තාවකාලික පදිංචිකරුවන් නිරන්තරයෙන් පචිංචිය හැරයාම සිදු කිරීම. එමෙන්ම ඔවුන්ගෙන් බහුතරයක් දෛනික ආදායම් මාර්ගවල නිරත වීම. (උදා. ත්‍රීවිල් රථ රියදුරන්, මේසන් හා ඇඟළුම් කර්මාන්තයේ යෙදෙන සෙවකයින්ආදිය) |
| **සංවර්ධන යෝජනා** | කුලී පදනම මත නිවාස හෝ කාමර ලබාදෙන සෑමවිටම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ශ්‍රී ලංකා පොලීසියේ ලියාපදිංචිය අනිවාර්යය කිරීම. |

## 2.8 සෞඛ්‍යය

වසම තුල සෞඛ්‍ය යටිතල පහසුකම් හා පහසුකම් හොඳ මට්ටමක පවතී. දෙහි/ ගල්කිස්ස මහ නගර සභාවේ ප්‍රජා වෛද්‍ය කාර්ය මණ්ඩලයක්, පවුල් සෞඛ්‍ය සේවිකාවන් වසම තුල ජීවත්වන ජනතැවගේ සෞඛ්‍ය යටිතල පහසුකම් කෙරෙහි නිරන්තර අධීක්ෂණයක් කරනු ඇත. ජනාකීර්ණ හා කාර්ය බහුල වසමක් වන මෙහි ගැබිණි කාන්තාවන් හා ළදරුවන් සඳහා පෝෂණ වැඩසටහන් සහ නිරන්තර අධීක්ෂණයන් සිදු කරනු ඇත. ළමා හා මාතෘ මරණ අනුපාතය ඉතා පහළ මට්ටමක පවතී.

වගුව 12 : ආයුර්වේද සායනයක් හා ඖෂධ ශාලාවක් ස්ථාපිත කිරීම

| | |
|---|---|
| **අවශ්‍යතාවය** | දේශීය ඖෂධ ප්‍රවර්ධනය හා දේශීය වෛද්‍ය ක්‍රම භාවිතය තුලින් රෝග නිවාරණය ප්‍රචලිත කිරීම මගින් සෞඛ්‍ය සම්පන්න නිරෝගිමත් ජීවිතයක් පවත්වාගෙන යාම. |
| **ගැටළුව** | දේශීය වෛද්‍යවරුන් ප්‍රමාණවත් පරිදි නොමැතිවීම හා දේශීය ඖෂධ ප්‍රවර්ධනය සඳහා ප්‍රමාණවත් වැඩ පිළිවෙලක් නොමැති වීම හා සායන පැවැත්වීම සඳහා ප්‍රමානවත් ඉඩ පහසුකම් නොමැති වීම. |
| **සංවර්ධන යෝජනා** | I. දේශීය ඖෂධ දෙපාර්තමේන්තුව සමඟ ඖෂධ සායන පැවැත්වීම සම්බන්ධයෙන් ක්‍රමවත් වැඩ පිළිවෙලක් සකස් කිරීම.<br>II. යෝජිත සේවා පියසේ හෝ ප්‍රජා ශාලාව තුල වෛද්‍ය සායනයන් පැවැත්වීම. |

## 2.9 පානීය ජල පහසුකම්

වසමේ ප්‍රජාවෙන් 98% ක් පමණ පිරිස නල ජලය භාවිතා කරයි. වසම තුල භූගත ජල ප්‍රවාහයන් බහුලව පැවතියද ප්‍රදේශයේ අධික ජනගහනය නිසා අපද්‍රව්‍ය බැහැර කිරීම ඉහළ මට්ටමක පැවතීම හේතුවෙන් හා මළ අපද්‍රව්‍ය ප්‍රවාහන පද්ධති භූගත ලෙස ස්ථාපිත කිරීමෙන් භූගත ජලය පරිභෝජනය

සඳහා සුදුසු මට්ටමේ නැත. ඇතැම් නිවාස සඳහා ළිං හා නළ ළිං දක්නට ලැබෙන අතර වසම තුල පොදු පරිභෝජනය සඳහා නාන ළිං දෙකක් හා නළ ළිං 2 ක් ඉදිකර ඇත.

අධික වියළි කාලගුණ තත්වයන් පවතින අවස්ථාවලදී ජල නල පීඩනය පහළ මට්ටමක පැවතීම හේතුවෙන් ජල පරිභෝජනය සඳහා බාධා ඇතිවේ. තවද භූගත ජල නල ඉතා පැරණි බැවින් නිරන්තරයෙන් අළුත්වැඩියා කිරීම් හේතුවෙන් ජල කප්පාදු කිරීම් දක්නට ලැබේ.

**වගුව 13 : ජල නල පීඩනය විධිමත් කිරීම**

| අවශ්‍යතාවය | ගැටළුව | වර්තමාන තත්වය (හොඳයි = 1, දුර්වල = 0) | ප්‍රතිලාභීන් ගණන | සංවර්ධන යෝජනා | වගකීම |
|---|---|---|---|---|---|
| උද්‍යාන වසමේ ජන ජීවිතය මූලිකවම නල ජල පරිභෝජනය මත පදනම් වී ඇති බැවින් කාර්ය බහුල වේලාවන් වලදී නල ජලයේ පීඩනය අවම වීම නිසා කාලය හා ශ්‍රමය අපතේ යැමක් සිදුවීම. | උද්‍යාන වසම මෙන්ම දෙහිවල සීමාව තුලට ජල සැපයුම එක් මධ්‍යස්ථානයකින් පමණක් සිදුවන බැවින් ඔවුන් විසින් පවත්වාගෙන යනු ලබන ධාරිතා මට්ටම ප්‍රමාණවත් නොවීම. | **0** | **1500** | අඩු පීඩන නිවාස සඳහා Pressure Valve සවි කිරීම.<br>අවශ්‍යතාවය මත ජල ටැංකි ස්ථාපිත කිරීම. | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය |

## 2.10 සනීපාරක්ෂක පහසුකම්

විශේෂයෙන් වසම තුල ඇති අඩු ආදායම් ලාභි නිවාස සඳහා ප්‍රමාණවත් වැසිකිලි පද්ධතියක් නොමැත. එක් නිවසක පවුල් දෙකක් හෝ තුනක් ජීවත්වන අතර ඔවුන් සඳහා ප්‍රමාණවත් අවම පහසුකම් සහිත වැසිකිලි දක්නට නොමැත. කුඩා ඉඩ ප්‍රමාණයක ජීවත්වන මොවුන් විසින් අවම සෞඛ්‍ය පුරුදු සහිත ජීවන රටාවක් පවත්වාගෙන යනු ඇත. විශේෂයෙන් ඇළ ඉවුර ප්‍රදේශයේ ඇති අනවසර ඉදිකිරීම් සහිත බොහොමයක් නිවාසවල මෙම තත්වය දක්නට ලැබේ.

වගුව 14 : **වසමේ සනීපාරක්ෂක පහසුකම්**

| **පහසුකම් වර්ගය** | **වර්තමාන තත්වය** |
|---|---|
| නිසි වැසිකිළි පද්ධතිය | 70% |
| ෆ්ලැෂ් වැසිකිළි | 22% |
| සාම්ප්‍රදායික වැසිකිළි | 8% |
| විවෘත අපවිත්‍ර වීම | නැත |
| මලාපවහන | ඇත |
| ජලාපවහන | ඇත |
| අපද්‍රව්‍ය කළමනාකරණය | ඇත |

සනීපාරක්ෂක යටිතල පහසුකම් නොමැතිකම සම්බන්ධයෙන්, පහත දැක්වෙන ප්‍රධාන ගැටළු කිහිපයක් හඳුනාගෙන ඇත.

- සමහර අවස්ථා වලදී වීදිවල අප ජලය ගලා යාම
- මදුරුවන් බෝවන ස්ථාන බහුල වීම
- ජලය එකතැන පල්වීම සිදුවේ
- සෞඛ්‍ය ගැටළු ඇති කරයි
- ජලය එකතැන පල්වීම වීදිවල වළවල් ඇති කරයි

## 2.11 ප්‍රජා සංවිධාන

සමාජ බලමුලු ගැන්වීම සහ ප්‍රාදේශීය ප්‍රජාව සංවිධානය කිරීම සහ දරිද්‍රතාවය අවම කිරීම සඳහා කටයුතු කිරීම

සහ වසමේ ජීවනෝපාය වැඩි දියුණු කිරීමේ ක්‍රියාකාරකම්. තවද, ඔවුන් ද අවශ්‍යතාවයට බෙහෙවින් සහාය වේ.

වසමේ සංවර්ධනය සඳහා ප්‍රමාණාත්මක හා ගුණාත්මක දත්ත හඳුනා ගැනීම සහ එකතු කිරීම කාර්ය සාධන දර්ශක ගණන මත පදනම්ව, ප්‍රාදේශීය ප්‍රජාව ඔවුන්ගේ තෘප්තිමත් මට්ටම ගෙන එනු ලබයි. වසමේ සේවය කරන මෙම ප්‍රාදේශීය සමාජ ආයතනවල ක්රියාකාරිත්වය පහළින් පිළිබිඹු වේ.

වගුව 15 : කාර්ය සාධනය පිළිබඳ තෘප්තියේ මට්ටම

| සංවිධානය | තෘප්තියේ මට්ටම (ඉතා හොඳයි, හොඳයි, සතුටුදායකයි, දුර්වලයි ඉතා දුර්වලයි) |
|---|---|
| දිරිය කාන්තා සංවිධානය | හොඳයි |
| ග්‍රාම සංවර්ධන සමිතිය | හොඳයි |
| උද්‍යාන ජොෂ්ඨ පුරවැසි සමිතිය | ඉතා හොඳයි |
| පුරවැසි උද්‍යාන පදනම | හොඳයි |
| සුපර් ෆ්‍රෙන්ඩ්ස් ක්‍රීඩා සමිතිය | දුර්වලයි |
| ලයන් හාට් ක්‍රීඩා සමිතිය | දුර්වලයි |

එවැනි බිම් මට්ටමේ සංවර්ධනය සඳහා ධාරිතා වර්ධනය හා සම්බන්ධතා සංවර්ධනය කිරීම සඳහා අඛණ්ඩව වැඩ කිරීමේ අවශ්‍යතාවයක් පවතී. වසමේ ප්‍රජා ආයතන භාර ගැනීමේදී ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළ හැකි බැවින් VDP හි හඳුනාගෙන ඇති කෙටිකාලීන හා දිගු කාලීන සංවර්ධන ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කළ යුතුය.

## 3 වන කොටස ජීවනෝපාය විශ්ලේෂණය

### 3.1 වෘත්තීන් වර්ග සහ ආදායම් මට්ටම

**a. ආදායම් මට්ටම**

වසමේ ජනගහනයෙන් බහුතරයක් ප්‍රධාන වශයෙන් පෞද්ගලික අංශයේ සේවය කරන බව පෙන්නුම් කරයි.

රැකියාවේ දෙවන විශාලතම කාණ්ඩය වන්නේ සේවා අංශයේය. ඉන්පසු රජයේ අංශයේ රැකියා සහ ව්‍යාපාර / ස්වයං රැකියාවල නියුතු අය. සීමිත සංඛ්‍යාවක්පුහුණු ශ්‍රමිකයින් ද නුපුහුණු ශ්‍රමය වසම තුල ඇත. රජයේ දෙපාර්තමේන්තු වල රැකියා කරන ගුරුවරුන් හෝ පුද්ගලයින්ගේ ඉහළම සාමාන්‍ය මාසික ආදායම රුපියල් 35000 සිට 45000 දක්වා වේ.

වගුව 16 : ස්වයං රැකියා වෙළඳපොළ නිර්මාණය කිරීම

| අවශ්‍යතාවය | ගැටළුව | වර්තමාන තත්වය(හොඳයි = 1,දුර්වල = 0) | ප්‍රතිලාභීන් ගණන | සංවර්ධන යෝජනා | වගකීම |
|---|---|---|---|---|---|
| බහුතර ශ්‍රමික ප්‍රජාවගේ ආදායම් මාර්ග ලෙස ස්වයං රැකියා සඳහා වඩාත් | ස්වයං රැකියා පුහුණු පාඨමාලා සඳහා රාජ්‍ය අනුග්‍රහය සහිත උපදේශකවරුන් හා පුහුණු සඳහා | 0 | 2800 | නවොත්පාදන ශිල්ප ක්‍රම හඳුන්වා දීම.<br>.<br>ඒ සඳහා සම්පත් දායකයින් විදාතා | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය<br>ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |

| | | | | | |
|---|---|---|---|---|---|
| නැඹුරු තාවයක් දක්වන අතර ඒ සඳහා අවශ්‍ය පුහුණුව හා දැනුම ලබාදීම මෙන්ම ඔවුන් විසින් නිෂ්පාදන කරනු ලබන භාණ්ඩ හා සේවා සඳහා වෙළඳපොළ අවස්ථාවක් සකසාදීම. | අවශ්‍ය උපකරණ සපයා ගැනීමේදී ඇතිවන දුෂ්කරතා හා පාඨමාලා පැවැත්වීම සඳහා සුදුසු ස්ථානයක් නොමැතිවීම මෙන්ම පුහුණුවෙන් පසු ඔවුන් විසින් කරනු ලබන නිෂ්පාදන සඳහා වෙළඳපොළ අවස්ථා අවම වීම. | | | **ආයතන හරහා සම්බන්ධීකරණය කර ගැනීම.**<br><br>**කරනු ලබන නිෂ්පාදන අලෙවිය සඳහා වෙළඳපොළ අවස්ථා පිළිබඳ දැනුමක් ලබාදීම**<br><br>**මාසිකව හෝ දින 60කට වරක් නිෂ්පාදන සඳහා භාණ්ඩ අලෙවි සල්පිල් පැවැත්වීම.** | |

### 3.2 දරිද්‍රතා මට්ටම

ධනය ශ්‍රේණිගත කිරීම මඟින් පවත්නා දරිද්‍රතාවය හඳුනා ගන්නා ලදී. වසමේ දරිද්‍රතා මට්ටම. දුප්පත්කම පිළිබඳ ඔවුන්ගේම හැඟීම් අනුව ඔවුන් නිර්ණායකයක් සකස් කරන ලදී. සාමාන්‍ය, දුප්පත්, දුප්පත්ම සහ අසරණ වැනි විවිධ කාණ්ඩ සඳහා ශ්‍රේණිගත කිරීම පිළිබඳ පරිණාමය වූ නිර්ණායක පිළිබඳ විස්තර. සොයාගැනීම්වලින් පෙනී යන්නේ 18% ක් වසමේ කුටුම්භ 571 ක් අඩු ආදායම් ලාභීන් ලෙස හඳුනාගෙන ඇත 48% සාමාන්‍යය ලෙස ජීවත් වන අතර ඉතිරිය ඉහල ආදායම් මට්ටමක සිටිනු ඇත.

**වගුව 17: සමෘද්ධි සංවර්ධනය හා වැඩිහිටි, ආබාධිත දීමනා**

| අවශ්‍යතාවය | ගැටළුව | වර්තමාන තත්වය(හොඳයි = 1,<br><br>දුර්වල = 0) | ප්‍රතිලාභීන් ගණන | සංවර්ධන යෝජනා | වගකීම |
|---|---|---|---|---|---|
| බහුතර ජනතාව අඩු ආදායම්ලාභී ජීවන මට්ටමක පැවතීම හේතුවෙන් සමෘර්ධි හා වැඩිහිටි, ආබාධිත දීමනා ගෙවීම ඉහළ දැමීම. | හිමිකරුවන් විශාල ප්‍රමාණයක් පැවතීම හේතුවෙන් ඒ සඳහා දැරිය යුතු පිරිවැය ඉහල අගයක් ගැනීම. | **0** | **2000** | **පොරොත්තු ලේඛනයට අනුව ප්‍රතිලාභ ගෙවීම කඩිනම් කිරීම.** | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය<br><br>ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br><br>සමෘද්ධි අමාත්‍යාංශය |

**3.3 ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා සංවර්ධනය**

උද්‍යාන ග්‍රාම නිළධාරී වසම තුල පිරිමි ආධිපත්‍ය සහිත සමාජ ක්‍රමයක් ඇත. කාන්තාවන්ගේ සාපේක්ෂව අඩු දායකත්වයක් දක්නට ඇත. විශේෂයෙන් තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී ගෘහස්ථ ප්‍රජා මට්ටමින් වියදම් දැරීම ළමින් හා විවිධ කාරණා වලදී කාන්තාවන්ගේ කාර්භාරය තරමක් ඉහල අගයක් ගනී. අධ්‍යාපන, .සංචලතාව, විවාහ වැනි කාරණා වලදී කාන්තාවන්ගේ වැඩි දායකත්වයක් දක්නට ඇත. වසම තුල කාන්තාවන් ගෘහය තුල සේවය කරන අතර අඩු ආදායම්ලාභී කුටුම්භ තුල කාන්තාවන්ගේ සේවානියුුක්තිය ඉහල අගයක් ගැනීම විශේෂ ලක්ෂණයකි.

වගුව **18** : **තීරණ ගැනීමේදී කාන්තාවන්ගේ කාර්යභාරය**

| පොදු තීරණ | කවුද තීරණය කරන්නේ | | | පිරිමි ගැහැණු ඒකාබද්ධව | | |
|---|---|---|---|---|---|---|
| | පිරිමි | ගැහැණු | ඒකාබද්ධව | පිරිමි ආධිපත්‍යය දරයි | ගැහැණු ආධිපත්‍යය දරයි | සමාන බලපෑම |
| වියදම් පිළිබඳ දෛනික කටයුතු සහ කුටුම්භ පාලනය | 1 | | | 1 | | |
| ආහාර, ඉවුම් පිහුම්, පෝෂණ | | 1 | | | 1 | |
| අධ්‍යාපනය සම්බන්ධ තීරණය / ළමුන් විශේෂයෙන් ගැහැණු ළමයින් සඳහා අධ්‍යාපනය | | | 1 | | 1 | |
| ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයටම අයිතිය ප්‍රවර්ධනය කිරීම | 1 | | | | | |
| සමාජ රැස්වීම්වලට සහභාගී වීමට තීරණය (විවාහ, අවමංගල්‍ය ආදිය) | 1 | | | | | 1 |
| සෞඛ්‍යය, ළමුන් සහ කාන්තාවන් සඳහා ප්‍රතිපාදන සෞඛ්‍යය සම්බන්ධ තීරණ, වෛද්‍ය පරීක්ෂණ | | 1 | | | 1 | |
| විවාහ ගිවිස ගැනීම සහ විවාහ තීරණ, විශේෂයෙන් ගැහැණු ළමයින් | 1 | | | | | 1 |
| උරුමය බෙදා හැරීම සහ අයිතිය ගැහැණු සතු උරුමය | | 1 | | | 1 | |
| ව්‍යාපාර මිලදී ගැනීම සහ විකිණීම | | 1 | | | | 1 |
| රන් / ස්වර්ණාභරණ මිලදී ගැනීමේ කරුණු විකිණීම | 1 | | | | 1 | |
| ගැටුම් නිරාකරණය / ආරවුල් | | | | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ආදිය | | | | | | |
| සංක්‍රමණය, මාරුව සහ චලනය යනාදිය | 1 | | | | | |

**සංවර්ධන අභියෝග**

### 3.4 ගම් ප්‍රජා මට්ටමේ සංවර්ධන අභියෝග

වසම තුල කුටුම්භයක් මුහුණ දෙන විවිධ ප්‍රජා මට්ටමේ සංවර්ධන අභි◌ියෝග විවිධාකාර වේ. අඩු ආදායම් ලාභි කුටුම්භ 571 ක් පමන වෙසෙන මෙම වසම තුල ප්‍රමාණාත්මක සනීපාරක්ෂක පහසුකම්, ආදායම් හිඟය, සෞඛ්‍ය පහසුකම් දුර්වල වීම, ජල නල පීඩනය අවම වීම. අවදානම්කාරී බෑවුම්වල නිවාස ඉදි කිරීම, ප්‍රධාන සංවර්ධන අභියෝග වේ. ඒ හා සමානව ඉඩම් හිඟය, ස්ථිර ජීවනෝපායන් නොමැති වීම, මත් ද්‍රව්‍ය සඳහා වැඩි නැඹුරුව, අඩු ආදායම් පවුල්වල ඉහළ අධ්‍යාපනය සඳහා දරුවන් යොමු වීමේ මන්දගාමී බව, තීරණ ගැනීමේදී විශේෂයෙන් අඩු ආදායම් ලාභි පවුල්වල කොන්දේසි වලට මුහුණ දීමට සිදුවීම වසම තුල ඇති ප්‍රධාන සංවර්ධන අභියෝග වේ.

**වගුව 19 : ප්‍රජා මට්ටමේ සංවර්ධන අභියෝග**

| අභියෝග | වර්තමාන තත්වය |
|---|---|
| අඩු ආදායම | 25% |
| ඉඩම් හිඟය | 80% |
| ආහාර නොමැතිකම | 5% |
| ජලයේ අඩු පීඩනය | 5% |
| මාර්ග නොමැතිකම | 10% |
| දුර්වල සනීපාරක්ෂාව | 15% |
| හානියට පත් නිවාස | 30% |
| කර්මාන් යෙදවුම් හිඟකම | 20% |
| දුර්වල ඇඳුම් | 10% |
| වෛද්‍ය පහසුකම්හි හකම | 15% |
| ගංවතුර / ඉඩම් නායයෑම් | 5% |

### 3.5 ගමේ තරුණ මට්ටමේ සංවර්ධන අභියෝග

වසමේ තරුණ සංවර්ධනය සඳහා ඇති ප්‍රධාන අභියෝග වන්නේ අධ්‍යාපන පහසුකම් සඳහා උනන්දුවව අවමවීම, රැකියාවේ ආතතිය, ප්‍රාග්ධනය හා රැකියා අවස්ථා නොමැතිකම සහ ආදායම්

උත්පාදනය කිරීමේ කුසලතා නොමැති වේ. වසමේ තරුණ තරුණියන් අතර විරැකියා අනුපාතය තරමක් ඉහළ ය.

විවිධ වූ ජීවනෝපාය ක්‍රම යටතේ තම ජීවිතය පවත්වාගෙන යන බහුවිධ පිරිසක් ජීවත්වන උද්‍යාන වසම තුල බහුතරයක් තම ශ්‍රමය කැපකර ආදායම් උත්පාදන මාර්ගවල නිරත වී ඇත. අනෙකුත් පිරිස වෘත්තිමය හා මානසික ශ්‍රමය වැය කර ආදායම් උපයාගනු ඇත. මෙම විශේෂිකරණය හේතුවෙන් පැහැදිලි ආදායම් බෙදීයාමේ විශමතාවයක් දක්නට ලැබේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස අඩු ආදායම්ලාභීන් ඉහළ අගයක් ගනියි.

වගුව 20 : තරුණ මට්ටමේ සංවර්ධන අභියෝග

| තරුණ 15-25 | සංවර්ධන අභියෝග | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | අධ්‍යාපනය | | ප්‍රාග්ධනය | | රැකියා | | නිපුනතාවය | |
| පිරිමි | Y | 80% | Y | 40% | Y | 75% | Y | 30% |
| ගැහැනු | Y | 85% | Y | 30% | Y | 60% | Y | 40% |

**3.6 වසම තුල ඇති පොදු සංවර්ධන අභියෝග**

වගුව 21 : ප්‍රජා ශාලාව වැඩි දියුණු කිරීම

| | |
|---|---|
| අවශ්‍යතාවය | ප්‍රජා ශාලාව සියළුම පහසකම් සහිතව නැවත සකස් කළ යුතුය. |
| ගැටළුව | ප්‍රමාණවත් ඉඩ පහසුකම් නොමැතිවීම. |
| සංවර්ධන යෝජනා | I. ප්‍රජා ශාලාව තුල වෘත්තීය පුහුණු පාඨමාලා (පරිගණක, ඉංග්‍රීසි, මැහුම්) ආරම්භ කිරීම. |

වගුව 22 : ඉරිදා පොළ සඳහා වාහන නැවැත්වීමේ ස්ථානයක් හඳුන්වාදීම

| | |
|---|---|
| අවශ්‍යතාවය | ඉරිදා පොළ සඳහා විශාල පාරිභෝගික ජනතාවක් පැමිණෙන අතර ඒ සඳහා වාහන නැවතුම්පොළක් නොමැති වීමෙන් පාරිභොගික ජනතාවට විවිධ දුෂ්කරතාවයන් සඳහා මුහුණ දීමට සිදුවේ. |
| ගැටළුව | වාහන නැවැත්වීම සඳහා ප්‍රමාණවත් ඉඩ පහසුකම් සහිත භූමි ප්‍රමාණයක් නොමැතිවීම. |
| සංවර්ධන යෝජනා | I. එස්. ද එස්. ජයසිංහ විද්‍යාලයේ ඒ සඳහා අවශ්‍ය ඉඩ පහසුකම් ලබාදීම.<br>II. වාහන නැවැත්වීම මගින් උපයාගන්නා මුදල් පාසල් සංවර්ධන කටයුතු සඳහා යොදා ගැනීම.<br>III. උපයාගන්නා ලද ආදායම නිවැරදිව ලේඛනගත කිරීම. |

වගුව 23 : දහම් පාසැල් සඳහා දරුවන් යොමු කිරීම

| | |
|---|---|
| අවශ්‍යතාවය | වසම තුල පවතින විහාරස්ථාන දෙක සඳහා දරුවන් ගෙන්වා ගැනීම සඳහා වැඩ පිළිවෙලක් සකස් කිරීම. |
| ගැටළුව | වසම තුල විහාරස්ථාන දෙකක් පැවතියද ඉන් එක් විහාරස්ථානයක පමණක් දහම් පැසැලක් පවත්වාගෙන යාම හේතුවෙන් ප්‍රදේශයේ දරුවන් වෙනත් දහම් පාසැල් සඳහා නැඹුරුවීමේ ප්‍රවණතාවයක් දක්නට ලැබේ. දහම් පාසැල් ගුරු හිඟය හා ඒ සඳහා අවශ්‍ය අනෙකුත් පහසුකම් අවම මට්ටමක පැවතීම මේ සඳහා හේතු වී ඇත. |
| සංවර්ධන යෝජනා | I. පියරතනාරාම විහාරස්ථානයේ නව දහම් පාසැලක් ආරම්භ කිරීම.<br>II. දැනට පවතින නව පොළොන්නරු ගල්විහාරයේ දහම් පාසැල සඳහා අවශ්‍ය සම්පත් ලබාදීම. |

## 4 වන කොටස ග්‍රාම සංවර්ධන සැලැස්ම

### උද්‍යාන වසම

### ග්‍රාම සංවර්ධන ක්‍රියාකාරී සැලැස්ම

වසම තුල හඳුනාගත් අවශ්‍යතාවයන් ප්‍රමුඛතාගත කොට ව්‍යුහාත්මක හා ව්‍යුහාත්මක නොවන සංවර්ධන අවශ්‍යතාවන්ට අනුකූලව උද්‍යාන වසම සඳහා ක්‍රියාකාරී සැලැස්ම පහත පරිදි දැක්විය හැකිය. මෙහිදී මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීමේදී,

I. ප්‍රජා සහභාගීත්ව පාරිසරික පාදක ඒකාබද්ධ සමානාත්මතා සංවර්ධන ක්‍රියාවලිය.
II. දේශීය සම්පත් ගවේෂණය කිරීම හා භාවිතා කිරීම.
III. ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව හා ප්‍රධාන ධාරාව.
IV. ආපදා අවදානම අවම කිරීම.
V. රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරිත්වය ප්‍රවර්ධනය කිරීම.කෙරෙහි මූලික අවදානය යොමු කර ඇත.

- මෙහිදී සැලසුම් කරන ලද ව්‍යුහාත්මක හා ව්‍යුහාත්මක නොවන ක්‍රියාවන් ස්වයං මූලධර්ම උපරිම ලෙස භාවිතයට ගනිමින් සාර්ථකව ක්‍රියාත්මක කිරීම අතිශයින්ම වැදගත් වේ.

- අවශ්‍ය මූල්‍ය හා තාක්ෂණික සම්පත් සාර්ථක ලෙස බලමුළු ගැන්වීම හා උත්පාදනය කිරීම.

- අදාල දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් ඇති රාජ්‍ය නොවන සංවිධාන, පරිත්‍යාගශීලීන් සම්බන්ධ කර ගැනීම.

- දැනටමත් පිහිටුවා ඇති බිම් මට්ටමේ ප්‍රජා ආයතන සහය හා මඟ පෙන්වීම ලබා ගැනීම.

- මූල්‍ය හා තාක්ෂණික සම්පත් උපරිම ලෙස භාවිතයට ගැනීමේ ක්‍රමවේදයන් ඒකාබද්ධව සකස් කිරීම.

- මෙහිදී ප්‍රාදේශීය වශයෙන් ලබා ගත හැකි ප්‍රජා නායකයින්ගේ අඛණ්ඩ ක්‍රියාකාරිත්වය අවශ්‍ය වේ.

**4.1** ව්‍යුහාත්මක ක්‍රියා

වගුව **24** : ව්‍යුහාත්මක ක්‍රියා

| අනු අංකය | ක්‍රියාකාරකම | ප්‍රජා ක්‍රියාකාරිත්වය | බාහිර වගකීම | කාල පරාසය |
| --- | --- | --- | --- | --- |
| 01 | සම්පූර්ණ සනීපාරක්ෂක සැලැස්ම සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම | ස්වේච්ඡා ශ්‍රමය, සම්පත් දායකත්වය | රජය හරහා ප්‍රදාන හෝ පරිත්‍යාගශීලීන් මඟින් ලබාගන්නා තාක්ෂණික සහාය, | අවුරුදු 01 |
| 02 | ජලාපවහනය ඉදිකිරීම | ස්වේච්ඡා ශ්‍රමය, සම්පත් දායකත්වය | රජය හරහා ප්‍රදාන හෝ පරිත්‍යාගශීලීන් මඟින් ලබාගන්නා තාක්ෂණික සහාය, | අවුරුදු 01 |
| 03 | පාරවල් හා කාණු ඉදිකිරීම | ස්වේච්ඡා ශ්‍රමය, සම්පත් දායකත්වය | වාර්ෂික දිස්ත්‍රික් සංවර්ධන සැලැස්මට ඇතුලත් කිරීම | අවුරුදු 01 |
| 04 | ළමා-මාතෘ සෞඛ්‍යය ස්ථාපිත කිරීම සත්කාර මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීම | ඉඩම් සැපයීම, ස්වේච්ඡා ශ්‍රමය, ද්‍රව්‍ය සැපයීම | සෞඛ්‍ය අංශ සමඟ සම්බන්ධ වී අවශ්‍ය තාක්ෂණික සහාය ලබා ගැනීම | අවුරුදු 02 |
| 05 | අධ්‍යාපනය සඳහා වැඩි අවස්ථා විවර කිරීම හා වෘත්තීය පුහුණු අවස්ථා ඇති කිරීම. | ස්වේච්ඡා ශ්‍රමය, සම්පත් දායකත්වය | අධ්‍යාපන අමාත්‍යංශය හා වෘත්තීය පුහුණු ආයතන හා වාර්ෂික දිස්ත්‍රික් සංවර්ධන සැලැස්මට ඇතුලත් කිරීම | අවුරුදු 02 |

**4.2.** ව්‍යුහාත්මක නොවන ක්‍රියා

වගුව **25** : ව්‍යුහාත්මක නොවන ක්‍රියා

| අනු අංකය | ක්‍රියාකාරකම | ප්‍රජා ක්‍රියාකාරිත්වය | බාහිර වගකීම | කාල පරාසය |
|---|---|---|---|---|
| **01** | ජීවනෝපාය වැඩි දියුණු කිරීම සහ ආදායම් උත්පාදනය කිරීමේ කුසලතා | ප්‍රතිලාභීන් හඳුනා ගැනීම හා සම්පත් දායකත්වයන් | අධ්‍යාපන අමාත්‍යාංශය හා වෘත්තීය පුහුණු ආයතන | අවුරුදු **02** |
| **02** | කුඩා ව්‍යාපාර පිහිටුවීම සහ ව්‍යවසායන් ඇති කිරීම | ප්‍රතිලාභීන් හඳුනා ගැනීම හා සම්පත් දායකත්වයන් | රාජ්‍ය බැංකු හා කුඩා ව්‍යාපාර සංවර්ධන ආයතනය වෘත්තීය පුහුණු ආයතන | අවුරුදු **02** |
| **03** | මහජන සෞඛ්‍ය කළමනාකරණය | ප්‍රතිලාභීන් හඳුනා ගැනීම හා සම්පත් දායකත්වයන් | සෞඛ්‍ය අංශ සමඟ සම්බන්ධ වී අවශ්‍ය තාක්ෂණික සහාය ලබා ගැනීම | අවුරුදු **02** |
| **04** | ගුරුවරුන්ගේ කුසලතා වැඩි දියුණු කිරීම පුහුණු කිරීම් | ස්වේච්ඡා ශ්‍රමය, සම්පත් දායකත්වය | අධ්‍යාපන අමාත්‍යාංශය හා වෘත්තීය පුහුණු ආයතන | අවුරුදු **01** |
| **05** | කාන්තා වෘත්තීය කුසලතා පුහුණු කිරීම් | ස්වේච්ඡා ශ්‍රමය, සම්පත් දායකත්වය | රාජ්‍ය බැංකු හා කුඩා ව්‍යාපාර සංවර්ධන ආයතනය වෘත්තීය පුහුණු ආයතන | අවුරුදු **03** |
| **06** | මත්ද්‍රව්‍ය නිවාරණය හා පුනුරුත්ථාපන ක්‍රියාවලිය | ප්‍රතිලාභීන් හඳුනා ගැනීම හා සම්පත් දායකත්වයන් | ආරක්ෂක අංශ, ජාතික අන්තරායක ඖෂධ පාලන අධිකාරිය | අවුරුදු **03** |